# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2071/83 - 2018 මැයි මස 18 වැනි සිකුරාදා - 2018.05.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**නිවේදනය**

1973 අංක 25 දරන ක්‍රීඩා පනත යටතේ නිකුත් කළ අංක 2068/25 සහ 2018.04.26 දිනැති *අති විශෙෂ ගැසට්* නිවේදනය අවලංගු කිරීම.

පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍ය ෆයිසර් මුස්තෆා වන මම, 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32 (ආ) සහ 33 වගන්ති යටතේ දුනු විදිමේ ක්‍රීඩාව සඳහා ජාතික සංගමය වන ශ්‍රී ලංකා දුනු විදීමේ සංගමයේ ලියාපදිංචිය අත්හිටුවන ලද අංක 2068/25 සහ 2018.04.26 දිනැති *ගැසට් නිවේදනය* 2018.05.18 වන දින සිට මෙයින් අවලංගු කරමි. ඒ අනුව, එකී ශ්‍රී ලංකා දුනු විදීමේ සංගමය ජාතික සංගමය වශයෙන් නැවත ලියාපදිංචිය ස්ථාපිත කරමි.

එකී නිලවරණය සඳහා අපක්ෂපාති නිලවරණ කමිටුවක් පත් කොට 2018 - 2020 වර්ෂය සඳහා නව නිලධාරි මණ්ඩලය පත් කර ගැනීම පිණිස නිලවරණය කැඳවීමට හා පැවැත්වීමට ශ්‍රී ලංකා දුනු විදීමේ සංගමයට මෙයින් නියම කරමි.

ෆයිසර් මුස්තෆා (පා.ම),
ජනාධිපති නීතිඥ,
පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍ය.

2018 මැයි මස 18 වැනි දින,
කොළඹ දීය.

06 - 299

1A - G 27689 - 12 (2018/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.